විෂය - නර්තනය

fY%Aණිය - 10

සතිය ජුලි 2

# 7.0 අත්දැකීම් ඇසුරු කර ගනිමින් ප්‍රාසාංගික කලාංග නිර්මාණය කරයි.

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa



හනික වරෙව් කොල්ලනේ ගීතය

- ග්‍රීක නාට්‍යයක් ඇසුරු කර ගනිමින්.
- බන්දුල ජයවර්ධන ශූරීන් නිර්මාණය කළ.
- බෙරහඩ අනුවර්තන නාට්‍ය.
- ජැක්සන් ඇන්තනි ඇතුළු පිරිස මෙම ගීතය ගායනය කරමින් රගති.

මෙම ගීතය සමූහ නර්තනයක් සඳහා සැකසුන එකකි.ගීතය මුල්ව ගයන ගායකයෙක්ද ඔහු අනුගමනය කරන පිරිසක් ද ඇත.හිරුදෙවියන්ගේ නැතිවූ ගව රංචුව සොයා ඒ මේ අත විමසමින් යන හිරුදෙවියන්ගේ ගව පාලකයන් (ගොපල්ලන්) පිළිබඳව ගීතයෙන් කියවේ.

නර්තනාංගය නිර්මාණය කිරීමේදි ඔබට කැමති ශෛලියක් අනුගමනය කළ හැකිය. නර්තනය තුළින් හාස්‍ය රසය මතු කිරිමට හෝ භයානක රසය මතු කිරිමට ඔබට අවශ්‍යය නම් නර්තන රචනය ඒ ආකාරයෙන් නිර්මාණය කළ හැකිය.කවර අයුරින් නිර්මාණය කළද අන්තර්ගතයේ දැක්වෙන්නේ හිරුදෙවියන්ගේ අතුරුදහන්වු ගවයන් සොයන ගොපල්ලන් පිරිස බව මතක තබාගත යුතුය.

## <u>නිර්මාණයේදී උපයෝගි කරගත හැකි චලන</u>



චලන නිර්මාණයේදී සැලකිළිමත් විය යුතු කරුණු.

1. අන්රතර්ජාලයෙන් ගීතය නැරඹීමට යොමුවන්න.
2. ගීතයේ ගායන ශෛලිය අවබෝධ කර ගන්න.
3. වචනාර්ථය -තාලය- රිද්මය -ප්‍රකාශනය පිළිබඳ අවබෝධය ලබා ගන්න.
4. තල දිශා අවකාශ භාවිතය උපයෝගී කර ගනිමින් පෙර සතියේ උගත් දේත් අන්තර්ජාලයෙන් දුටුදේත් භාවිත කරමින් නර්තන අංගය නිර්මාණය කරන්න.

- ඇගයීම

<u>හිස්තැන් පුරවන්න.</u>

බන්දුල ජයවර්ධන මහතා නිර්මාණය කළ ------------------ග්‍රීක නාට්‍යක අනුවර්තනයකි.

මෙම නාට්‍යගීතයට අනුව ගොපල්ලන් සොයනුයේ ------- ගේ අතුරුදහන් වූ -----------ය.

නාට්‍යා ගීතය සඳහා ගායනයෙන් හා රංගනයෙන් දායක වන්නේ------------ ප්‍රමුඛ කණ්ඩායමයි.

- ගීතය

හනික වරෙව් කොල්ලනේ -මෙන්න මෙහෙ වරෙව්  //

මෙන්න මෙහෙ වරෙව් කොල්ලනේ -නට නටා වරෙව් //

තොපිට හරිම වාසියක් -නටනටා වරෙව් //

වැඩේ අමාරුත් නැතේ -තෑගී ටිකත් අපි අතේ

රත්තරනින් ගෙවන්නේ-හිරු දෙවියොයි කියන්නේ//

මෙන්න මෙහෙ වරෙව් කොල්ලනේ -නට නටා වරෙව් //

තොපිට හරිම වාසියක් -නටනටා වරෙව් //

සාදු සාදු කියල්ලා -ප්‍රීති ඝෝෂා කරල්ලා

හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ කන්ද උඩින් වරෙල්ලා//

හිරු දෙවිඳුගෙ හරක් ගත්ත හරක් හොරා හොයල්ලා//

වනන්තරේ හොයාපියෝ -ගල් අරඹේ හොයාපියෝ

වන කතරේ හොයාපියෝ -මිනිස් වාසෙ හොයාපියෝ

කඳු මුදුනේ ගං ඉවුරේ වනන්තරේ හොයාපියෝ

හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ අපි -අපිට දෙවියො බලාපියෝ

රන් අබරණ පැලඳ ගත්තු -මහ පොළවේ රන් වපුරන

හිරු දෙවියෝ බලාපියෝ

හරක් හොරා හොයා ගන්න සියලු දෙවියො පිහිට වෙයෝ

ඕ.........ඕ.........ඕ